www.xtrapapers.com

Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2021**

INSERT **1 hour 30 minutes**

*7246788770-I*

**INFORMATION**

- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages.


© UCLES 2021

www.xtrapapers.com



Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–12** on the Question Paper.

ශ්‍රී ලංකාවට සංචාරයක් සඳහා යන හැම දෙනාම පාහේ බලන්නට අමතක නොකරන ස්ථානයකි "සීගිරිය". මෙය මහා පර්වතයක් මත ඉදි කොට ඇති බලකොටුවකි. සිංහයෙකුගේ රුවට සමාන අන්දමින් නිම කොට ඇති බැවින් එයට "සිංහ ගිරිය" හෙවත් "සීගිරිය" යන නම ලැබී ඇත.

සීගිරියේ මේ විශේෂත්වය නිසා අප මේ ස්ථානය නැරඹිය යුතු යැයි මගේ පියා යෝජනා කර සිටියේ ය. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව පවුලේ සංචාරයක් සඳහා යා යුතු ස්ථානයක් ගැන පවුලේ ඇති වූ කතාබහක දී මේ දේ තීරණය විය. එහෙත් මා බලාපොරොත්තුවෙන් සිටියේ නැවතත් සීතල දේශගුණයක් ඇති නුවරඑළිය පලාතට යාමටය. නමුත් මගේ පියා ගේ අදහස වූයේ අප කිහිප වරක්ම නිවාඩු සඳහා නුවරඑළියට ගොස් තිබෙන බැවින් මෙවර වෙනත් තැනකට යා යුතු බවයි. තවදුරටත් ඔහුගේ අදහස ස්ථිර කරමින් මගේ පියා කියා සිටියේ සීගිරිය ලංකාවේ පුරාණ අගනුවරක් වූ බැවින් එහි ඓතිහාසික වැදගත්කම හේතුවෙන් මෙය අප අනිවාර්යයෙන් බැලිය යුතු වටිනා ස්ථානයක් බවයි.

සීගිරිය ලෝක උරුමයක් ලෙසට ජාත්‍යන්තර වශයෙන් නම් කොට තිබෙන බව ඊට ඇතුල් වන ස්ථානයේ තිබෙන දැන්වීම් පුවරු වලින් මම දුටුවෙමි. සීගිරියට ගිය ගමන ඉතා විනෝදජනක විය. එදිනෙදා පාසැලේ පාඩම් කටයුතු වලින් බැහැර වීමට ඉඩ ලැබීම මෙන්ම පවුලේ අය සමග විනෝදජනක අවස්ථාවක් ගත කිරීමට ලැබීම එයට හේතු විය.

මේ ස්ථානය නැරඹීම සඳහා අප වේලාසනින් එතැනට ලඟා විය යුතු බවට මගේ පියා දුන් උපදෙස නිවැරැදි බව ද මට වැටහී ගියේ ආරක්ෂක නිලධාරීන් පැවසූ කරුණු අනුව ය. උදය කාලය සීගිරිය නැගීම සඳහා යෝග්‍ය බව ඔවුන් සඳහන් කලේ තද අව් රශ්මිය ඇඩි විඩාවක් ගෙන දිය හැකි බැවිනි. එමෙන්ම සවස් වනවිට තද සුළං හැමීමේ හැකියාවක් ඇති බව ද ඔවුන් පෙන්වා දුන්නේ ය.

මගේ මව විසින් සකසා පිළියෙළ කරගෙන පැමිණ තිබූ උදය ආහාර ඉතා ඉක්මනින් අවසන් කල අපි සියලුදෙනා ඉතා උනන්දුවෙන් සීගිරිය නගින්නට පටන් ගත්තෙමු.

සීගිරි පර්වතය මුදුනේ සිට පෙනෙන අවට දර්ශනය ඉතාමත් රමණීය ය. තවත් වටිනා ස්ථාන රැසක් මෙහි දී අපට දකින්නට ලැබේ. එහෙත් ඊටත් වඩා වැදගත් අංගයන් දෙකක් සීගිරියේ දක්නට ලැබේ. "කැටපත් පවුර" නමින් හැඳින්වෙන දිස්නයක් සහිත බිත්තියක් මෙහි ඇත. මෙය මත "කුරුටු ගී" යනුවෙන් හැඳින්වෙන යමක් ලියා තිබේ. සීගිරිය නැරඹීමට පැමිණි අය විසින් අතීත කාලයේ පටන් ලියා ඇති මේ ගී වර්තමානයේ දී ඉතා වැදගත් දෙයක් ලෙසට සලකා ආරක්ෂා කරනු ලැබේ.

ඒ වාගේම සීගිරියේ ඇති තවත් අගනා මෙන්ම ලෝක ප්‍රසිද්ධ අංගයක් වනුයේ එහි ඇති "බිතු සිතුවම්" ලෙසින් හැඳින්වෙන ඉතා දර්ශනීය චිත්‍රයි. මල් අතින් දරා සිටින කාන්තා රූප ඉතා අලංකාර ලෙස සීගිරි ලෙන් තුල ඇඳ තිබේ. මේවා ක්‍රිස්තු වර්ෂ 6 වැනි සියවසට අයත් වූ ඒවා බව ඉතිහාසඥයින් පවසා ඇත. එබැවින් මෙම චිත්‍ර වසර දෙදහසකටත් වඩා පැරණිය. එහෙත් අද ද ඒවා ආරක්ෂා කොට ඇත්තේ රාජ්‍ය දේපල හැටියට ය. මේවාට මොනයම් හෝ ආකාරයකට හානි පැමිණවීම අපරාධ වරදක් ලෙස හැඳින්වේ.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which itself is a department of the University of Cambridge.

© UCLES 2021